**රාජ්‍ය දැව සංස්ථාව**

**රාජ්‍ය දැව සංස්ථාවේ සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්කරන පුද්ගලයන්ට හා ආයතන වලට බලපාන කොන්දේසි**

**2023**

---

<u>මුල් පිටපත නිසියාකාරව පුරවා අයදුම්පත සමඟ නැවත එවිය යුතුය.</u>

1. මිල ගණන් ඉදිරිපත් කරන ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ට එම මිල ගණන් විවෘත කරන වේලාවට එහි පැමිණ සිටිය හැකි අතර විවෘත කරන දිනය හා වේලාව එම මිල ගණන් කැඳවීමේ ලිපියේ සඳහන් වනු ඇත.

2. සැපයුම් කරනු ලබන භාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාව දක්වන පිරිවිතරයන්ට අනිවාර්යයෙන්ම අනුකූල විය යුතු අතර ඒවා අවශ්‍ය ගුණයෙන් හා ප්‍රමාණයෙන්ද යුක්ත විය යුතුය.

3. නියම කරනු ලබන තත්වයන්ට / පිරිවිතරවලට අනුකූල නොවන සැපයුම් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් හෝ ආපසු භාරදීමට අයිතිය රාජ්‍ය දැව සංස්ථාව සතුවන අතර ඒ සඳහා වන වියදම් සැපයුම්කරුවන් විසින් දැරිය යුතුය.

4. මිලට ගැනීමේ ඇණවුමෙහි **"භාරදීම"** යනුවෙන් අදහස් කරනුයේ **"නියම වශයෙන් භාණ්ඩ භාරදීම හා පිළිගැනීම වේ".** මිලයට ගැනීමේ ඇණවුමෙහි සඳහන්වන භාණ්ඩ භාරදී අවසානයේ එකී ඇණවුමෙහි සඳහන් දින 14 ක් ඇතුලත හෝ නොඑසේ නම් රාජ්‍ය දැව සංස්ථාව විසින් නියම කරනු ලබන වෙනත් දිනයකට පෙර එය සම්පූර්ණයෙන් භාරදීමෙන් පසුව වේ·

5. සපයනු ලබන භාණ්ඩ /ද්‍රව්‍ය වලින් කොටසක් හෝ සම්පූර්ණයෙන් පිලිගැනීම,ප්‍රතික්ෂේප කිරීම,අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා අයිතිය රාජ්‍ය දැව සංස්ථාව සතුවේ.

6. ඉදිරිපත් කරනු ලබන ඇණවුම්වල සඳහන් ගුණයන්ට හා ප්‍රමාණයන්ට අනුකූල අන්දමින් හා එකගවී ඇති භාරදීමේ දිනයන්ට සැපයීමට අපොහොසත්වීම මගින් සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු වීමට ඉඩ එවැනි සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කෙරෙනු ඇත.

7. රාජ්‍ය දැව සංස්ථාව විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවේදී සැපයුම්කරු විසින් සාම්පල් 02 ක් ලබා දිය යුතුය.

8. සැපයුම්කරු විසින් සඳහන් කරනු ලබන මිල ගණන්,එම මිල ගණන් කැඳවීමේ දින සිට දින 45ට නොඅඩු කාලයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විවෘතව තබනු ඇත.

9. මෙසේ දක්වනු ලබන මිල ගණන් විවෘත කළ දින සිට දින 60 ට නොඅඩු කාලයක් තුල නොවෙනස්ව පවතිනු ඇත.

10. එක් එක් ද්‍රව්‍යයේ මිල එහි ඉදිරියේ දක්වමින් නැවත අකුරෙන්ද සඳහන් කළ යුතුය.

11. මිල ගණන් පත්‍රයේ දැක්වෙන සියලුම වෙනස් කිරීම්, අවලංගු කිරීම හෝ මකා දැමීම මිල ගණන් අත්සන් කර ඇති සැපයුම්කරු විසින් නිසි පරිදි සහතික කල යුතුය.

12. මිල ගණන් පෝරමයෙහි ඇති සියලුම තීරු සම්පූර්ණ කළ යුතුය.අදාල තොරතුරු සඳහන් නොවන පෝරම අසම්පූර්ණ මිල ගණන් සේ සලකා සැලකිල්ලට ගනු නොලැබේ.

13. ඉදිරිපත් කර ඇති සියලුම මිල ගණන් අදාල පිරිවිතරයන්ට සම්පූර්ණ වශයෙන් අනුකූල විය යුතුය.

14. ඇණවුම් කරන ලද භාණ්ඩ වලින් කොටසක් සපයා ඉතිරි කොටස් දින 14ක් තුලදී සැපයීමට අපොහොසත් වුවහොත් සපයන ලද භාණ්ඩවල වටිනාකමින් 90% ක් පමණ ගෙවා ඇණවුම අවලංගු කරනු ලැබේ.ඉතිරි 10% කුමන හේතුවක් මත හෝ ගෙවනු නොලැබේ.

15. කුමන හේතුවක් නිසා හෝ ප්‍රමාද වී ලැබෙන මිල ගණන් භාරගනු නොලැබේ.

16. සියලු මිල ගණන් බහාලන කවරවල උඩ වම් කෙලවරේ මිලගණන් අංකය,විවෘත කරන දිනය, හා විස්තරය ද සඳහන් කළ යුතු අතර **සභාපති, ප්‍රසම්පාදන කමිටුව,රාජ්‍ය දැව සංස්ථාව,රජමල්වත්ත පාර, බත්තරමුල්ල** යන නමට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.අතින් ගෙනෙන මිල ගණන් ද ඉහත ලිපිනයේ සඳහන් සභාපති අංශයේ ඇති මිල ගණන් පෙට්ටියේ බහාලිය යුතුය. ප්‍රසම්පාදන අංකය සඳහන් නොවන පෝරම සැළකිල්ලට ගනු නොලැබේ.

17. ඕනෑම මිලගණන් පත්‍රයක් **<u>සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමට</u>** ද මිල ගණන් පත්‍රයේ දැක්වෙන කවර හෝ ප්‍රමාණයේ කොටසක් හෝ පිළිගැනීමට රාජ්‍ය දැව සංස්ථාවට අයිතිය තිබේ.මිල පත්‍රයේ සඳහන් සම්පූර්ණ ප්‍රමාණයන් මිලදී ගැනීමට රාජ්‍ය දැව සංස්ථාව අපොහොසත්වීම හෝ අතපසුවීම හේතුවෙන් කිසිදු අලාභයක් හෝ හානියක් සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් කිසිදු වන්දියක් ඉල්ලීමට සැපයුම්කරුවන්ට හිමිකමක් නැත.

18. රාජ්‍ය දැව සංස්ථාවෙන් සාම්පල් ඉල්ලීමට සැපයුම්කරුවන්ට කිසිදු අයිතියක් නැත.එහෙත් රාජ්‍ය දැව සංස්ථාවේ අභිමතය පරිදි සාම්පල් පරික්ෂා කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී සැපයුම්කරු විසින් හෝ නිසි පරිදි ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයකු විසින් හෝ ඒවා ඉදිරිපත් කළ යුතුය.

19. පිළිගනු ලබන ද්‍රව්‍ය/භාණ්ඩ සැපයුම්කරු විසින් නියමිත ස්ථානයේ ගෙනවිත් තැන්පත් කරදීමෙන් අනතුරුව අවශ්‍ය ගුණයන්ට/පිරිවිතරයන්ට අනුකූල නොවනබව පෙනී ගියහොත් එවැනි දෑ ප්‍රතික්ෂේප කර යවන ලිපියේ සඳහන් දින සිට දින 07ක් ඇතුලත සැපයුම්කරුගේ වියදමින් ඒවා ඉවත් කරගෙන යා යුතුය.එසේ ප්‍රතික්ෂේප කරනු ලබන ද්‍රව්‍ය//භාණ්ඩ වෙනුවෙන් වන්දියක් ඉල්ලා සිටීමට සැපයුම්කරුවන්ට කිසිදු අයිතියක් නොමැත.

20. ඉතාම කෙටි කාලයක් තුල සැපයුම් කළයුතු නිසාත් ඇතැම්විට දුරකථන මගින් ඇණවුම් ඉදිරිපත් කිරීමට සිදුවන නිසාත් **<u>සැපයුම්කරුවන්ට අත්‍යාවශ්‍යයෙන්ම දුරකථන පහසුකම් තිබියයුතුය</u>.**

21. ද්‍රව්‍ය/භාණ්ඩ සැපයීම අයදුම්කරු විසින්ම කළයුතු වන අතර එහිලා අතුරු කොන්ත්‍රාත්කරුවන්ට නොදිය යුතුය.

22. සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන්නේ සංස්ථාව විසින් තෝරා ගනු ලබන ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙනි.තරගකාරී මිල ගණන් ලබා ගැනීම සඳහා බාහිර සැපයුම්කරුවන්ගෙන් වුවත් මිල ගණන් කැඳවීමේ අයිතිය රාජ්‍ය දැව සංස්ථාව සතුවේ.

23. ඇණවුම සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට **<u>දින 30ට නොඅඩු කාලයක් සඳහා සැපයුම්කරු විසින් රාජ්‍ය දැව සංස්ථාව වෙත ණය පහසුකම් ලබා දිය යුතුවේ.</u>**

24. සම්පූර්ණ කරනු ලබන ඇණවුම් සඳහා ගෙවීම් කරනුයේ චෙක්පත් මගිනි. චෙක්පත් නිකුත් කරනු ලබන්නේ සාමාන්‍යයෙන් පහත දැක්වෙන අයුරින් සැපයුම්කරුවන්ගේ නමිනි.
    1. ආදායකයාගේ ගිණුමට පමණයි.
    2. අන්සතු කළ නොහැක.

25. රාජ්‍ය දැව සංස්ථාව විසින් සැපයුම්කරු වෙත එවනු ලබන ලිපි ලේඛණ ආදිය සැපයුම්කරු විසින් අවසන් වරට සපයා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබීම එහිලා ප්‍රමාණවත් දැනුම්දීමක් වශයෙන් සළකනු ලැබේ.

26. ඕනෑම සැපයුම්කරුවකුගේ ලියාපදිංචිය කිසිදු හේතුවක් නොදන්වා අවලංගු කිරීමට රාජ්‍ය දැව සංස්ථා සභාපතිට බලය ඇත.

27. සැපයුම්කරුවන් එකතුකළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අංකය සඳහන් කිරීම අනිවාර්ය වන අතර, VAT සඳහා ලියාපදිංචි වී නොමැති නම්, ඒ සඳහා ලියාපදිංචි වී නොමැති බවට දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්ගෙන් සහතිකයක් ලබාගෙන මේ සමඟ අමුණා එවිය යුතුය.

28. ඉදිකිරීම් වැඩ සඳහා ඉදිරිපත්වන කොන්ත්‍රාත්කරුවන් සඳහා CIDA ලියාපදිංචිය අනිවාර්යයෙන් තිබිය යුතු අතර එමෙන්ම මිල ගණන් කැඳවීමේදී ආයතනය විසින් ඉල්ලුම්කරන නිර්ණායක හා කොන්දේසි සපුරාලිය යුතුය.

29. මෙහි සඳහන් කර ඇති කොන්දේසි වලට සැපයුම්කරුවන් සිය දැඩි අනුකූලතාවය දැක්විය යුතු අතර එහි කොන්දේසි ඇතුලත හෝ ඉන් බාහිරව හෝ පවතින කවර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වුවද රාජ්‍ය දැව සංස්ථාව විසින් නියම කරනු ලබන තීරණ එහිලා අවසන් තීරණය වනු ඇත.

**කළමණාකාර (මිලදී ගැනීම් හා නාවික)**
**<u>රාජ්‍ය දැව සංස්ථාව</u>**

**අ.ක.ලේ/**
**සභාපති**
**<u>රාජ්‍ය දැව සංස්ථාව</u>**

---

රාජ්‍ය දැව සංස්ථාවට භාණ්ඩ, වැඩ හා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ඉහත කී කොන්දේසි සියල්ල මෙහි පහත අත්සන් කරන මා/අප විසින් කියවා තේරුම් ගෙන එකී කොන්දේසිවලට අනුකූලවීම හා එකඟවීමෙන් මාගේ/අපගේ අත්සන/අත්සන් මෙහි තබමු.

..................................................
අයඳුම්කරුගේ අත්සන

අයඳුම්කරුගේ නම :- ..........................................................................

දිනය :- ..........................................................................

ආයතන මුද්‍රාව :- ..........................................................................

**රාජ්‍ය දැව සංස්ථාව**

**<u>2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය</u>**

මෙම පෝරමය කොන්දේසිවල මුල් පිටපත් සමඟ නිසියාකාරව පුරවා **2023.11.17** දිනට පෙර අංක: 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, රාජ්‍ය දැව සංස්ථාවේ කළමනාකාර (මිලදීගැනීම් හා නාවික) වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**01.** සැපයුම්කරුගේ /ආයතනයේ නම : .......................................................
.......................................................

**02.** සම්බන්ධීකරන විස්තර:

- ලිපිනය : .......................................................
  : .......................................................
- දුරකථන අංකය : .......................................................
- ජංගම දුරකථන අංකය : .......................................................
- වට්ස්ඇප් (WhatsApp) අංකය : .......................................................
- ෆැක්ස් අංකය : .......................................................
- විද්‍යුත් තැපැල් ලිපිනය : .......................................................

**03.** ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය : .......................................................
(පිටපත් ඇමිණිය යුතුයි)

**04.** එකතු කළ අගය මත ලිපි ගොණු
අංකය හා 2021/ 2022 වර්ෂවල
ගෙවූ බදු මුදල් : .......................................................

**05.** සැපයුම්කරුගේ ගෙවීම් කළ යුතු බැංකු ගිණුම් විස්තර

- ගිණුම් අංකය : .......................................................
- බැංකුව හා ශාඛාව : .......................................................

**06.** ලාංකිකයෙකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම්,
ලියාපදිංචි අංකය හා දිනය : .....................................................

**07.** CIDA ලියාපදිංචි අංකය හා දිනය
(පිටපත ඇමිණිය යුතුයි) : .......................................................

**08.** අයිතිකරුන්ගේ, කොටස්කරුවන්ගේ හා අධ්‍යක්ෂකවරුන්ගේ නම්:

.......................................................................................................................................

.......................................................................................................................................

**09. ණය පදනම මත සැපයිය හැකි උපරිම කාලසීමාව...........................................................................**

**10. ලියාපදිංචිය අපේක්ෂා කරන කාණ්ඩය පහත වගුවේ x ලකුණින් සලකුණු කර පෙන්වන්න.**
(2022.10.13 දිනමිණ සහ ඩේලි නිවුස් පුවත්පත් දැන්වීමෙහි සදහන් කාණ්ඩ අංක සහ උප කාණ්ඩ අනුව ලියාපදිංචිය අපේක්ෂා කරන කාණ්ඩය නිවැරදිව තෝරන්න)

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | **a** | **b** | **c** | | | | | | | **14** | **a** | **b** | | | | **25** | **a** | **b** | **c** | **d** | | **38** | **a** | **b** | **c** | | | |
| **2** | **a** | **b** | **c** | **d** | **e** | **f** | **g** | | | **15** | **a** | | | | | **26** | **a** | **b** | **c** | | | **39** | | | | | | |
| **3** | **a** | **b** | **c** | **d** | **e** | **f** | **g** | **h** | **i** | **16** | | | | | | **27** | **a** | | | | | **40** | | | | | | |
| **4** | **a** | | | | | | | | | **17** | | | | | | **28** | | | | | | **41** | **a** | **b** | **c** | **d** | **e** | **f** |
| **5** | **a** | **b** | **c** | | | | | | | **18** | | | | | | **29** | **a** | **b** | | | | | **g** | **h** | **i** | | | |
| **6** | **a** | **b** | | | | | | | | **19** | **a** | **b** | **c** | **d** | **e** | **30** | **a** | **b** | **c** | | | **42** | **a** | **b** | **c** | **d** | **e** | **f** |
| **7** | **a** | **b** | **c** | | | | | | | | **f** | **g** | **h** | **i** | **j** | **31** | **a** | **b** | **c** | | | **43** | | | | | | |
| **8** | **a** | **b** | | | | | | | | | **k** | **l** | **m** | | | **32** | | | | | | **44** | | | | | | |
| **9** | **a** | | | | | | | | | **20** | | | | | | **33** | **a** | | | | | **45** | | | | | | |
| **10** | **a** | **b** | **c** | | | | | | | **21** | | | | | | **34** | **a** | **b** | | | | **46** | | | | | | |
| **11** | **a** | **b** | | | | | | | | **22** | | | | | | **35** | | | | | | **47** | | | | | | |
| **12** | **a** | **b** | **c** | | | | | | | **23** | | | | | | **36** | **a** | | | | | | | | | | | |
| **13** | **a** | | | | | | | | | **24** | | | | | | **37** | **a** | | | | | | | | | | | |

**11.**

| | |
|---|---|
| **කාන්ඩ අංක** | |
| **ලදුපත්/කුවිතාන්සි/චෙක්පත් අංක** | |
| **ලදුපත්/කුවිතාන්සි/චෙක්පත් දිනය** | |

**12. බැංකුවට ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර**

ගෙවන ලද මුළු මුදල: ............................................. ......

බැංකුවේ සහ ශාඛාවේ නම: …………… .........................

චෙක්පත් අංකය සහ දිනය:………………………………………………….

ඉහත 01 හි සඳහන් කර ඇති පුද්ගලයන් වෙනුවෙන් මෙහි පහත අත්සන් කරන මම/අපි ඉහත දක්වා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය 2023 සඳහා අයදුම් කිරීම සඳහා ලබා දී ඇති කොන්දේසි හා උපදෙස් වලට අනුකූල වීමට එකඟ වෙමි/ වෙමු.

අත්සන් කළ අයගේ නම ………………………………………………………….

බලයලත් නිලධාරියාගේ අත්සන හා දිනය: ............................... ……………………..

ආයතනයේ නම ……………………………………………..